**කොත්මලේ ප්‍රාදේශීය සභාව - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම්වල එකතුව රු.139,084,859 ක් වූ අතර එය ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට සමාන විය යුතු වුවත්, එහි ශේෂය රු.134,745,052 ක් වීම හේතුවෙන් රු.4,339,807 ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ණයගැති ශේෂය රු.37,786,842 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.41,407,282 ක් ලෙස රු.3,620,440 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | දේශිය ණය හා සංවර්ධන අරමුදල ලද රු.3,620,440 ක ණය මුදල ණයගැති කර්මාන්ත ලැබීම් තුළ අන්තර්ගත වී ඇති බැවින් ණයගැති ශේෂය උප ලේඛන තුළ අඩුවෙන් පෙන්වා ඇති බව . | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ඇ) | රම්බඩ දියඇල්ල කර්මාන්තය සඳහා ලැබිය යුතු රු.3,620,440 ක මුදල පියවා තිබුණද, එය තවදුරටත් කර්මාන්ත ණයගැතියන් ලෙස දක්වා තිබුණි. | විගණනය විසින් පෙන්වා දිමෙන් අනතුරුව එම වටිනාකම කර්මාන්ත උප ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.6,412,083 ක් හා උපලේඛන අනුව වටිනාකම රු.1,398,463 ක් වුයෙන් රු. 5,013,620 ක වෙනසක් විය. | උප ලේඛනය සකස් කිරීමේදී එකතු කිරීමේ දෝෂයකින් සටහන් වී ඇති බව | නොසැසඳීම් හඳුනාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 28,575,448 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,169,328 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| i. | හිඟ ආදායම් රු.3,442,775 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට දේපල තහනම් කටයුතු සිදු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| ii. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව හිඟ ආදායම් අය කර ගැනීම සිදුකළ යුතු වුවද, 2020 ජනවාරි 01 දිනට රු.1,506,055 ක වරිපනම් බදු හිඟයෙන් අයකර තිබුණේ රු.717,988 ක් හෙවත් සියයට 48 ක් පමණි. අක්කර බදු රු.91,250 න් රු.22,315 ක් හෙවත් සියයට 24 ක්ද, අයකර තිබුණි. ජල බදු රු.577,130 ක හිඟයෙන් අයකර තිබුණේ රු.158,650 ක් හෙවත් සියයට 27 ක් පමණි. | හිඟය අයකර ගැනීමට දේපල තහනම් කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් රැස්කිරීම නිසි ලෙස ඉටු කළ යුතු වීම. |
| (ආ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 | එම මුදල ගෙන්වා ගැනීමට කටයුතු කරන | ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,936,831 ක් හා මුද්දර ගාස්තු රු.5,142.470 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බව. | |

(ඇ) **වෙනත් ආදායම්**

-----------------

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ස්ථාන 07 ක දුරකථන කුලුණු 07 ක් පවතින අතර වාර්ෂික ගැසට් පත්‍රය අනුව යෝජනාවක් සම්මත කර සභාවට එම කුලුණ මඟින් ආදායමක් උපයාගත හැකි තත්ත්වයක් පැවතියද ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට සන්නිවේදන කුළුණ සඳහා ව්‍යාපාර බදු අය කිරීමට ආදායම් සැකසීමට කටයුතු කරන බව. | නව ආදායම් මාර්ග උත්පාදනයට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේ සිට 2020 දක්වා කාලය තුළ පෞද්ගලික පාර්ශවයන් විසින් සිදුකළ අනවසර ඉදිකිරීම් 299 ක් හඳුනාගෙන තිබුණි. ඉන් 243 ක් සම්බන්ධයෙන් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගෙන නොතිබුණි. | ගොඩනැගිලි 04 ක් කඩා ඉවත් කර ඇති බවත්, ගොඩනැගිලි නිත්‍යානුකූලව ඉදි කිරීම සඳහා තවත් අයදුම්කරුවන් 52 ක් නිකුත් කර ඇති බවත්, නැවත භාර දුන් ගොඩනැගිලි අයදුම්පත් 24 න් 12 ක් අනුමත කර ඇත. 12 ක් මේ වනතෙක් අඩුපාඩු බැවින් අනුමත කර නොමැති බවත් 146 ක් නඩු පැවරීම් කටයුතු සඳහා සූදානම් කර ඇති බව. | අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.37,786,842 ක් වූ අතර වර්ෂයක කාලයක් ඉක්මවා හිඟ හිටි ප්‍රමාණය රු.12,226,721 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් ඉදිරි වර්ෂය තුළ නිරවුල් කරන බව. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු විම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණය හිමි ශේෂය රු.53,016,881 ක් වූ අතර, එම ශේෂයෙන් වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු.14,737,652 ක් තිබුණි. මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අවසන් ගිණුම් සැකසීමේදී මෙම ණයහිමි ශේෂයන්ද නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම |

**3.2 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාව විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම රු.75,717,510 ක් විය . ඒ යටතේ සභා කාර්යාලය පවතින අක්කර 02 ක් පමණ වූ ඉඩම සඳහා පමණක් ප්‍රකාශන ඔප්පුවක් තිබුණි. අනෙකුත් ඉඩම් (සහා ගොඩනැගිලි සහිත ඉඩම්ද ඇතුළුව) සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු හෝ පැවරුම් නියෝග සභාව සතුව නොපැවතුණි. | මෙම සභාවට අයත් ඉඩම් ඔප්පු හා පැවරුම් ලබා ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙතින් මේ වනවිටත් ඉල්ලුම් කර ඇති බව. | වත්කම්වල අයිතිය තහවුරු කර ගත යුතු වීම. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| නවංගම පානීය ජල ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 01 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 15 දින වැඩ නිම කර රු.1,979,598 ක බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර 2021 ජූනි 26 දින රු.1,067,766 ක මුදලක් ගෙවීම්කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය මඟින් පානීය ජලය ලබාදීමට අපොහොසත් වී තිබුණි. පැවති පැරණි කළුගල් බැම්ම කඩා ඉවත් කර එහි අළුතින් බැම්මක් ඉදිකර තිබුණද ප්‍රමාණවත් ජල පිරවුමත් සිදු වී නොතිබුණි. මෙහි බැම්ම ඉදිකිරීම සඳහා පාදම සකස් කිරීම සඳහා පස් කැපීම හේතුවෙන් ඉහළ ඉවුර කඩා වැටීමත් සිදුවී තිබුණි. | සංවර්ධන යෝජනාවේ අඩුපාඩු නිසා කොන්ත්‍රාත්කරුට කොටස් ගෙවීමක් කර ඇති බව. | ඇස්තමේන්තු හා නියමිත පිරිවිතර අනුව අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර වාර්ෂික අයවැය තුළින් අනුමත කළ රු.2,435,000 ක් වටිනා ව්‍යාපෘති 18 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර හෝ නොතිබුණි. | 2021 වර්ෂයේ ජූලි මස අවසන් වීමට පෙර මෙම සංවර්ධන යෝජනා සියල්ලා අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව. | ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

.